මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2019 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා උපලේඛනය

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - **2018.09.06**

| අංකය | නිලධාරියාගේ නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලේඛනයේ අනු අංකය | අයදුම්පත් උපලේඛනයේ අනු අංකය | අභියාචනයේ සඳහන් කරුණු | අභියාචනයෙන් කෙරෙන අවසන් ඉල්ලීම | වෙනත් කරුණු | අභියාචනා මණ්ඩලයේ තීරණය |
|---|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව** | | | | | | | | |
| 01. | එස්.එච්.පී.එස්. සමරතුංග මයා | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - | - | 1. 2019 වර්ෂයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට නොහැකි වූ බැවින් ඒ සඳහා අයදුම් කිරීමට<br>2. 2013.01.01 දින මුදල් අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර ඇත. | රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | - | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |
| 02. | එස්.ඒ.කේ.සී. කුමාරි මිය | තක්සේරු දෙපාර්තමේන්තුව | - | 41 | 1. සේවා කාලය තුළ කිසිදු ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර නොමැත.<br>2. 2019 ජනවාරි මස 08 වන දිනට මාගේ වයස අවු. 56 සම්පූර්ණ වේ. එබැවින් 2019 ස්ථාන මාරු නොලදහොත් අවු. 04ක්වත් සේවය කිරීමට නොහැකි වේ.<br>3. ස්වාමිපුරුෂයා විශ්‍රාමිකය.<br>4. දරුවන් තිදෙනෙකු සිටින අතර, ඔවුන් තිදෙනාම උසස් අධ්‍යාපනය ලබමින් සිටී. එබැවින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා විශාල වියදමක් දැරීමට සිදු වේ. | රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | - | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 03. | පී.ආර්. ශාන්ති මිය | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | - | - | සේවය කරන දෙපාර්තමේන්තුවේ අතපසුවීමකින් මෙම නිලධාරිණියගේ අයදුම්පත යොමු කර නැත. | රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | - | ඉල්ලීම ඉටු කිරීමට තීරණය කරන ලදී. |
| 04. | බී.ඒ. දයන්ති මිය | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 14 | 16 | 1. ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනට මුදල් අමාත්‍යාංශයේ සේවා කාලය වසර 7 ½කට ආසන්න වේ. | 2019 ජනවාරි මස රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති ස්ථාන මාරුව ක්‍රියාත්මක කර දෙන ලෙස ඉල්ලා ඇත. | 2018.12.31 දිනට වයස අවු. 47 මාස 06 දින 07 ක් වේ. | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |
| 05. | ඩී. සුබසිංහ මයා | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 23 | 39 | 1. 2018.05.19 දිනට වයස අවුරුදු 55 සම්පූර්ණ වීම නිසා රේගු දෙපාර්තමේන්තුවේ වසර 05ක කාලයක් සම්පූර්ණ කිරීමට අවස්ථාව අහිමි වීම.<br>2. මා 2013.01.01 මුදල් අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර ඇති අතර සේවා කාලය වසර 05 මාස 08ක් වේ.<br>3. රජයේ මුළු සේවා කාලය වසර 34කි.<br>4. 2019.12.18 රේගු දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වූ විට එහි සේවය කළ හැක්කේ වසර 3 ½ක් පමණි.<br>5. රාජකාරි කාලයේ දී කිසිදු විවේක නිවාඩුවක් ලබා නොමැත.<br>6. දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා වියදම් දැරීමට සිදු වීම හා භාර්යාව රැකියාවක් නොකිරීම | රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුව සාධාරණව ලබා දෙන ලෙස ඉල්ලීම | - | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 06. | සි.ජේ. ගමගේ මයා | තක්සේරු දෙපාර්තමේන්තුව | 15 | 20 | 1. 2018 පොරොත්තු ලේඛනයට ඇතුළත් වී ඇත.<br>2. නමුත් 2019.09.10 දිනට රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලැබී ඇත. | කිසියම් ප්‍රමාද දෝෂයක් වී ඇත්නම් එය නිවැරදි කර දෙන ලෙස ඉල්ලා ඇත. | 2018 වර්ෂයේ පොරොත්තු ලේඛනය ඇතුළත් වුව ද 2019 වර්ෂයේ ස්ථාන මාරු ලේඛනය සකස් කිරීමේ දී නැවත අයදුම්පත් කැඳවීම සිදු කරන බැවින් 2018 වර්ෂයේ පොරොත්තු ලේඛනය 2019 වර්ෂයට අදාළ වන්නේ නැත. | ප්‍රමාද දෝෂයක් සිදු වී නොමැත. |
| 07. | පී.කේ.ජේ. ෆොන්සේකා මයා | තක්සේරු දෙපාර්තමේන්තුව | - | 139 | 1. 2005.03.01 දින සිට 2006.12.31 දක්වා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යාල සේවක සේවයේ තනතුරක සේවය කර ඇත.<br>2. 2007.01.01 දින සිට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පත්වීම ලැබී ඇති අතර එවකට 2007 පෙබරවාරි මස සිට රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලැබී තිබී ඇත.<br>3. මේ වනවිට වයස අවු. 51 වේ. මුදල් අමාත්‍යාංශය වෙත දෙවනවරට පැමිණ වසර 05කට ආසන්න කාලයක් ගත වී ඇත. | පෙර සිටි කාලය ද සැලකිල්ලට ගෙන ලේඛනයේ සුදුසු ස්ථානයක තබන ලෙස ඉල්ලා ඇත. | - | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | එල්.බී.කේ. ලක්සිරි මිය | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | - | - | 1. 2019 වර්ෂය සඳහා ස්ථාන මාරු අයදුම් කිරීමට නොහැකි වී ඇති අතර අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ඉල්ලා ඇත. | - | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |
| 02. | එච්.පී. සුනේත්‍රා දීපානි මෙය | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 7 | වසර 02ට අඩු ලේඛනයේ 21 | 1. දැනට පරිවාස කාලයෙ පසුවීම<br>2. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ තවදුරටත් සේවය කිරීමට ඇති කැමැත්ත<br>3. දෙවන මනාපය ලෙස නොදැනුවත්කමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළත් කිරිම | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කර දෙන ලෙ ඉල්ලා ඇත. | - | ඉල්ලීම ඉටු කිරීමට තීරණය කරන ලදී. |
| 03. | ඒ.එම්.ජී. අධිකාරි මිය | තක්සේරු දෙපාර්තමේන්තුව - මහනුවර | - | වසර 02ට අඩු ලේඛනයේ 1 | 1. තක්සේරු දෙපාර්තමේන්තුවට 2017.01.05 සේවයට වාර්තා කර ඇත.නමුත් එම කාර්යාලයේම සේවය කරන 2018.03.20 දින සේවයට වාර්තා කළ නිලධාරිණියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා දී ඇත.<br>2. වයස අවුරුදු 53ක් වන අතර 55න් විශ්‍රාම යාමට අදහස් කර ඇත.<br>3. 1999 වර්ෂයේ මහනුවර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ස්ථාන මාරුව හා 2010 වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ස්ථාන මාරු අවලංගු කරන ලදී. | මහනුවර දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලයට හෝ මහනුවර සුරාබදු ප්‍රාදේශීය කාර්යාලය ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. | ඇය සඳහන් කරන එච්.එම්.අයි.ඒ. කුමාරි හේරත් මහත්මිය ස්ථාන මාරු ඉල්ලා ඇත්තේ දේශීය ආදායම් ප්‍රධාන කාර්යාලය වෙත වන අතර මෙම නිලධාරිණිය ස්ථාන මාරු ඉල්ලා ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාල වෙතය. | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 04. | ඩබ්.ඒ.එම්.කේ. අබේරත්න මිය | තක්සේරු දෙපාර්තමේන්තුව | 8 | 138 | 1. අවුරුද්දක් වයසැති නිවුන් දරුවන් සිටීම නිසා නිතර නිවාඩු ලබා ගැනීමට සිදු වීම (මසකට දින 1 ½ක් පමණ)<br>2. ප්‍රතිලාභ ලබා ගැනීමේ දී ඉහත කරුණ බලපෑම<br>3. දරුවන්හට වයස අවුරුදු 3ක් වූ පසු දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට යොමු කිරීමට බලාපොරොත්තු වන බැවින් ඉන්පසු ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට අදහස් කරයි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ස්ථාන මාරුව අවලංගු කර දෙන ලෙස ඉල්ලා ඇත. | - | ඉල්ලීම ඉටු කිරීමට තීරණය කරන ලදී. |
| 05. | එච්.එම්.අයි.ඒ.කේ. හේරත් මිය | තක්සේරු දෙපාර්තමේන්තුව - මහනුවර | 5 | වසර 02ට අඩු ලේඛනයේ 15 | 1. ස්වාමි පුරුෂයාගේ හදවත් සැත්කමක් සිදු කර ඇති බැවින් ප්‍රතිකාර ලබා ගැනීමට පදිංචිය ආසන්නයේ සිටීමට සිදුවීම<br>2. පාසැල් යන වයසේ දරුවන් දෙදෙනෙකු සිටින අතර එක් දරුවකු 2019 වර්ෂයේ අ.පො.ස. (සා/පෙළ) සඳහා පෙනී සිටීමට නියමිතය.<br>3. පදිංචිය මහනුවර පල්ලෙකැලේ ප්‍රදේශයේ වේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත ලබා දුන් ස්ථාන මාරුව මහනුවර ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇත. | - | දේශීය ආදායම් ප්‍රධාන කාර්යාලය වෙත ලබාදුන් ස්ථාන මාරුව අවලංගු කිරීමට තීරණය කරන ලදී. |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | | | | | | |
| 01 | එස්.පී.එස්. අමරතුංග මයා | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 3 | 190 | 1. සුරාබදු දෙපාර්තමේන්තුව වෙත දිනපතා නිවසේ සිට ගමන් කිරීමට ඇති දුෂ්කරතාව<br>2. මෙතෙක් පැවති පෞද්ගලික ගැටලු විසඳාගෙන ඇති බැවින් පෙර ගත් තීරණය වෙනස් කිරීම<br>3. දිනපතා අමාත්‍යාංශය වෙත දුම්රියෙන් නියමිත වේලාවට ළඟාවීම පහසු වීම | රේගු දෙපාර්තමේන්තුව සඳහා ස්ථාන මාරු ඉල්ලා ඇත. | - | සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ස්ථාන මාරුව අවලංගු කිරීමට තීරණය කරන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 02. | ලංකා ගරුසිංහ මිය | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | - | 1. වසර 14ක් පුරා කොළඹ ප්‍රදේශයේ සේවය කරන ලදී.<br>2. දියණිය 2019 වසරේ පාසල් යාමට නියමිත අතර දැනට ඇය දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ තබා රැකියාවට පැමිණෙයි.<br>3. පෞද්ගලික ගැටලු හා දුෂ්කරතා මධ්‍යයේ රාජකාරි සඳහා පැමිණෙයි. | කළුතර සුරාබදු කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ඉල්ලා ඇත. | - | ඉල්ලීම ඉටු කිරීමට තීරණය කරන ලදී. |
| 03. | එම්.ඩී.වයි.කේ. සමරකෝන් මිය | තක්සේරු දෙපාර්තමේන්තුව - මහනුවර | - | 202 | 1. තක්සේරු දෙපාර්තමේන්තුවට 2016.03.01 දින සේවයට වාර්තා කර ඇත.නමුත් එම කාර්යාලයේම සේවය කරන 2018.03.20 දින සේවයට වාර්තා කළ නිලධාරිණියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා දී ඇත.<br>2. වයස අවුරුදු 53ක් වන අතර 55න් විශ්‍රාම යාමට අදහස් කර ඇත. | මහනුවර සුරාබදු කාර්යාලයට හෝ මාතලේ සුරාබදු කාර්යාලයට හෝ දේශීය ආදායම් මහනුවර කාර්යාලයට ස්ථාන මාරුවක් ඉල්ලා ඇත. | ඇය සඳහන් කරන එච්.එම්.අයි.ඒ. කුමාරි හේරත් මහත්මිය ස්ථාන මාරු ඉල්ලා ඇත්තේ දේශීය ආදායම් ප්‍රධාන කාර්යාලය වෙත වන අතර මෙම නිලධාරිණිය ස්ථාන මාරු ඉල්ලා ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාල වෙතය. | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 04. | පී.පී. ද සිල්වා මයා | තක්සේරු දෙපාර්තමේන්තුව | - | වසර 02ට අඩු ලේඛනයේ 16 | 1. ආර්ථික අපහසුතා පවතී.<br>2. 2019.09.03 දින සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබා දී ඇති නමුත් ඔහුට වඩා වයසින් බාල නිලධාරීන්ට 2019 ජනවාරි මාසයේ ස්ථානමාරු ලබා දී ඇත. | 2019 ජනවාරි හෝ පෙබරවාරි මාසයන්හි ස්ථානමාරුව ක්‍රියාත්මක කර දෙන ලෙස ඉල්ලා ඇත. | මෙම නිලධාරියා 2018.03.28 දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර ඇත. | ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. |

..............................
එම්.ඒ.එස්.වීරසිංහ මයා
අධ්‍යක්ෂ ජනරාල්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

..............................
හේමාල් කස්තුරිආරච්චි මයා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

..............................
ආර්.එම්.ජේ. රත්නායක මයා
ගණකාධිකාරී
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය